# ගස් කැපීම සඳහා බලපත්‍ර ලබා ගැනීම.

කොස්,දෙල් ,තල් වැනි සීමිත ගස් කැපීම සඳහා ඕනෑම කෙනෙකු විසින් බලපත්‍ර ලබා ගැනීම අත්‍යාවශ්‍යවේ.

**සුදුසුකම්**

කොස්,දෙල්,තල් ගස් කැපීම සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ පහත සඳහන් අවස්ථාවලදීය.

- උසාවිය මගින් තීන්දුව දුන් පසුව
- සංවර්ධන කටයුතු සඳහා ගස් ඉවත් කිරීමට සිදු වන අවස්ථාවල කෘෂිකර්මික සංවර්ධන (මාර්ග සංවර්ධනය හෝ මාර්ග පළල් කිරීම විදුලි බලය සැපයීම වැනි අවස්ථා)
- ගෙයක් තනන අවස්ථාවකදී ගෙය සැලැස්මට මැදිවූ අවස්ථාවකදී
- ස්වභාවික හේතූන් මත කෘෂිකර්මික
- ගස් වලින් ජීවිත වලට හා දේපල වලට හානි සිදුවීමේ හේතුවෙන්.

* දිරාගිය ගස්.

<u>අවශ්‍ය කරන ආධාරක ලියකියවිලි</u>

- ග්‍රාම නිලධාරීතුමාගේ නිර්දේශය
- ඉඩමේ ඔප්පුව
- ඉඩමේ සැලැස්ම
- ගෙයි හා වෙනත් ගොඩනැගිලි පිළිබඳ සැලැස්ම
- වෙනත් අය සමඟ සම්බන්ධ ඉඩමක් නම් අනිත් හවුල් කරුවන්ගේ කැමැත්ත ග්‍රාම නිලධාරී විසින් සනාථ කරන ලිපිය.
- උසාවියෙන් දෙන ලද තීන්දුවක් ඇත්නම් ඒ ලියකියවිලි.

- ප්‍රාදේශීය සභාව මගින් දෙන තීන්දුවක් ඇත්නම් ඒ ලියකියවිලි

**ඉල්ලුම්පත භාර දීම**

සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ග්‍රාම නිලධාරීට භාර දිය යුතුය.  ඉන්පසු ග්‍රාම නිලධාරී විසින් එම ඉල්ලුම් පත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාර දෙනු ලැබේ.

සැ.යු:
ඉල්ලුම් කරුගේ අයිතිය තහවුරු කිරීම සඳහා ඉඩමේ ගොඩනැගිලි හා නිවසේ, සැලැස්ම හා ඔප්පුව අවශ්‍ය වේ.  මේ ගස් වලට ගොඩනැගිලි වලට හා නිවසට වන කරදර තහවුරු කිරීම සඳහා.

<u>පියවරෙන් පියවර ක්‍රියාවලිය</u>

පියවර 1: ඉල්ලුම්කරු විසින් අදාළ ග්‍රාම නිලධාරී ඉල්ලුම්පතක් ලබා ගත යුතුය.

පියවර 2: අවශ්‍ය කරන ලියකියවිලි සහිතව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත ග්‍රාම නිලධාරීට භාර දිය යුතුය.

පියවර 3:ග්‍රාම නිලධාරී විසින් කරන ලද වාර්තාව ඉල්ලුම්පත සමඟ ඇමිණිය යුතුය.

පියවර 4:ග්‍රාම නිලධාරී විසින් සපයන ලද ලියකියවිලි සහිත ඉල්ලුම්පත අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාර දෙනු ඇත.

පියවර 5: ප්‍රාදේශීය ලේකම් තුමා හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් සත්වැනි පරික්ෂණය සිදුකල හැක.

පියවර 6: ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ලේකම් විසින් ඉල්ලුම්පත අනුමත කල පසු අයදුම් කරන්නා බලපත්‍රයක් නිකුත් කල හැකිය.

**විශේෂ කරුණු**

**1. ඉ.ස.අ. බලපත්‍ර සහිත ඉඩම් වලින් ගස් කැපීම**

- එල්. ඩී. බලපත්‍ර සහිත ඉඩමකින් ගස් කැපීම සඳහා බලපත්‍ර අනිවාර්ය වේ.

- එල් එල් පර්මිට් ලබා ගැනීමෙන් පසු තමා විසින් වවන ලද ගසක් කැපීමට හා ප්‍රවාහනය කිරීමට අවසර ලබා ගැනීමට නම් ගස අවුරුදු 20 ක් පරණ වීම ගසේ කඳ අඩුම තරමේ අඩි 3 1/2 මහත් වීම අවශ්‍යා වේ.
- කෙසේ වුවද ඇලෙස්ටෝනියා ලූණු මිදෙල්ල, වල් සපු, ඇල්බීසියා, ඉපිල් ඉපිල් වැනි ගස් කැපීම හා ප්‍රවාහනය කිරීම සඳහා පවා අවුරුදු 15 ක් ගත විය යුතු අතර, ගස් වල කඳ මහත අඩි 2 2/1 කම වැඩි විය යුතුය.
- බලපත්‍රයක් ලබා ගැනීමට පෙර තබූ ස්වභාවික ගස් එම ඉඩමේ තනන වර්ග අඩි 1200 අඩු ගොඩනැගිල්ලක් හෝ නිවසක අවශ්‍යතා සඳහා උපරිම ඝන මීටර් 7 ක් දක්වා ගස් කපා ගැනීමට බලපත්‍රයක් ලබා ගත හැක. එවැනි ඉල්ලීමක් සළකා බලනුයේ ඉඩමේ බලපත්‍රයට වසර 3ක් සම්පූර්ණ වී ඇත්නම් පමණි

**2. ස්වර්ණ භූමි ජය භූමි ප්‍රදානය ඉඩම් උරුමයන්හි ගස් කැපීම**

ඉඩමේ සීමාව ඇතුළත තිබෙන කොස් , දෙල්, තල් ගස් හැර අනෙකුත් ගස් කපා ගැනීමටද බලපත්‍රයක් අවශ්‍යා වේ.  ගස් කපා ගැනීමට සුදුසු බලපත්‍රයක් ලබා ගත හැක්කේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනි.

**3.දිර්ගකාලින බදු ඉඩම් වලින් ගස් කපා ගැනීම**

දීමනා පත්‍රයක් සකසා නැති මධ්‍යම පංතියේ ඉඩම් වලින් ඉවත් කෙරෙන දැව රාජ්‍ය දැව සංස්ථාව වෙත බාර දිය යුතුය

**4.වාර්ෂික බලපත්‍ර සහිත ඉඩමී වල දැව හෙලීම**

වාර්ෂික බලපත්‍ර සහිත ඉඩම් වල කිසිම ගසක් කිසිම තැනකින් කපා ගැනීමට හිමිකමක් නොමැත. මැරුණ හෝ කඩා වැඩුනු ගසක්, අයින් කිරීමේදී රජයේ දැව සංස්ථාව වෙත යොමු කළ යුතුය.